# සාමාන්‍ය සමයේ විසිසත්වන සතිය
# සඳුදා

## පළමුවන කියැවීම

ජෝනා දිවැස්ප්‍රසාදි තුමන්ගේ පොතෙන් පාඨයෙකි.

ජෝනා 1 : 1-17, 2: 10

"ජෝනා ස්වාමින් වහන්සේ මග හැර පලා යයි."

සමිඳාණන් වහන්සේගෙන් අමිත්තයිගේ පුත් ජෝනාට පැමිණි පණිවුඩය මෙසේ ය. "නැගිට නිනිවය නම් ශ්‍රේෂ්ඨ නගරයට ගොස් ඊට විරුද්ධව මොර ගසන්න. මන්ද, එහි වැසියන්ගේ දුෂ්ඨකම මට ඉතා හොඳින් පෙනේ. "එහෙත්, ජෝනා සමිඳාණන් වහන්සේ මගහැර පලා යන පිණිස තර්ෂිෂ් යන්නට පිටත් විය. ඒ සඳහා ඔහු ජෝප්පාවට ගියේ ය. එහි දී ඔහුට තර්ෂිෂ්ට යන නැවක් හමු වී, ඊට ගාස්තුව ගෙවා සමිඳාණන් වහන්සේ වෙතින් පලා යන පිණිස තර්ෂිෂ් බලා යන නැවකට නැගුණේ ය.

එහෙත්, සමිඳාණන් වහන්සේ මුහුද පිට තද සුළඟක් හමන්නට සැලසූ සේක. එයින් මුහුදේ මහා කුණාටුවක් ඇති වී නැව බිඳෙන්නට විය. එවිට නාවිකයෝ බිය වී, එක එකා තම තමාගේ දෙවියන්ට මොර ගැසුවෝ ය. ඔව්හු නැව සැහැල්ලු කර ගන්න පිණිස එහි තිබුණු බඩු මුහුදට විසි කළෝය. එහෙත්, ජෝනා නැවේ පහත තට්ටුවට බැස ගොස් බර නින්දකට වැටී හුන්නේය.

එවිට නැව්පතියා ඔහු ළඟට අවුත්, "ඔබ හොඳටම නිදාගෙන සිටීමේ තේරුම කුමක්ද? නැගිට ඔබේ දෙවියන්ගෙන් පිහිට ඉල්ලන්න. සමහරවිට උන් වහන්සේ අප විනාශ නොවන ලෙස අප ගැන සලකනු ඇතැ"යි කීහ.

එකල නාවික පිරිස තම තමන් අතරේ කතා කර ගනිමින්, “මේ විපත්තිය අපට පැමිණුනේ කවරෙකු නිසා දැ යි දැන ගන්න පිණිස පස ඇට දමමු”යි කීහ. ඒ අනුව ඔව්හු පස ඇට දැමූහ. පස ඇටය ජෝනාට වැටිණි.

එවිට ඔව්හු ජෝනාගෙන් ප්‍රශ්න කරමින්, “අපට පැමිණි මේ වින්නැහියට වගකිව යුත්තේ කවරෙක් ද? ඔබේ රැකියාව කුමක්ද? ඔබ කොහේ සිට ආවෙහි ද? ඔබේ රට කුමක්ද? ඔබේ ජාතිය කුමක්දැ”යි ඇසූහ.

ඔහු පිළිතුරු දෙමින්, “මම හෙබ්‍රෙව් ජාතිකයෙක්මි. මම මුහුදත් ගොඩබිමත් මැවූ ස්වර්ගයේ දෙවි සමිඳාණන් වහන්සේ අදහමි”යි කීය. ඔහු සමිඳාණන් වහන්සේ වෙතින් පලා යන බව ඔවුන් දැනගෙන සිටි නිසා ඔව්හු ඉතා බියපත් වී, “ඔබ කළ මේ හදිය කුමක්දැ”යි ඇසූහ. කුණාටුව වඩ වඩාත් වේගවත් වූ බැවින්, “මුහුද නිශ්චල වන පිණිස අප ඔබට කුමක් කළ යුතු දැ”යි ඔව්හු ඔහුගෙන් ඇසූහ.

“මා රැගෙන මුහුදට බිලි දෙන්න. එවිට මුහුද නිශ්චල වනු ඇත. මේ මහ කුණාටුව ඇති වී තිබෙන්නේ මා නිසා බව මම දනිමි”යි ඔහු ඔවුන්ට කීවේ ය.

කෙසේ වෙතත්, නාවික පිරිස වෙරළට පැමිණෙන පිණිස වඩාත් වීර්යයෙන් නැව පැදවූහ. එහෙත් මුහුද වඩ වඩා සැරෙන් ඔවුන්ට විරුද්ධව නැඟී ආ බැවින් ඔවුන්ට එසේ කරන්නට බැරි විය.

එවිට ඔව්හු සමිඳාණන් වහන්සේට හඬ ගසා, “අහෝ සමිඳාණන් වහන්ස, මේ මිනිසාගේ ප්‍රාණය නිසා අප පිට විනාශයක් නොවේවා. නිදොස් කෙනෙකුගේ මරණයට අපි වගකිව යුත්තෝ නොවෙම්වා! මන්ද සමිඳුනි, ඔබේ කැමැත්ත පරිදි ඔබ ක්‍රියා කළ සේකැ”යි කීහ.

ඉන්පසු ඔව්හු ජෝනා මුහුදට බිලි දුන්හ. එවිට මුහුදේ කැළඹීම නැවතිණි. මේ හේතුවෙන් නාවික පිරිස සමිඳාණන් වහන්සේ කෙරෙහි අතිශයින් බියපත් වී, උන් වහන්සේට පූජාවක් ඔප්පු කර භාරහාර පිදූහ.

සමිඳාණන් වහන්සේ ද ජෝනා ගිලගත්න පිණිස මහා මත්ස්‍යයෙකු සූදානම් කළ සේක. ඒ මත්ස්‍යාගේ කුස තුළ ජෝනා දාවල් තුනක් ද රෑ තුනක් ද සිටියේය.

සමිඳාණන් වහන්සේ මත්ස්‍යයාට කතා කළ සේක. එවිට ඌ ජෝනා ගොඩබිමට වැමෑරිය.

දේව වචනය මෙසේ ය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 2 : 2-4, 7

පිළිතුර: සමිඳුනි, ඔබ වහන්සේ මා පාතාලයෙන් ගොඩගත් සේක.

ගීය:

"මාගේ පීඩාවේ දී සමිඳුන්ට හඬ ගැසීමි.
එතුමාණෝ මට පිළිතුරු දුන් සේක. පාතාල ගැබේ සිට කෑ ගැසීමි.
ඔබ මාගේ හඬ ඇසූ සේක.

ඔබ මුහුද මැද ගැඹුරට මා හෙළූ සේක. ජලධාරාවෝ මා සිසාරා සිට ගත්හ. තරංග හා ජල කඳ සියල්ල මට උඩින් ගලා ගියේය.

එවිට මම මෙසේ කීමි. "ඔබ ඇස් හමුයෙන් මම පහ කරනු ලැබීමි. එබැවින් ඔබේ ශුද්ධ මාලිගාව දෙස නැවත බලන්නේ කෙසේ ද?

මාගේ පණ කෙන්ද මැලවී යද්දී මම සමිඳුන් සිහි කළෙමි.
මාගේ අයැදුම ඔබ වෙත නැගුණේය. ඔබේ ශුද්ධ මාලිගාවට පැමිණියේ ය."

## සුපුවත් ජය නද (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
"මා ඔබට වදාළ වචන ආත්මය ද ජීවනය ද වන්නේය.
සදාතන ජීවනයේ වචන ඇත්තේ ඔබවහන්සේ වෙත ය."
ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
"මම ඔබට නව පණතක් දෙමි.
මා ඔබට ප්‍රේම කළාක් මෙන් ඔබත් එකිනෙකාට ප්‍රේම කරන්නැ"යි සමිඳාණෝ වදාරන සේක.
ආලේලූයා!

## සුවිශේෂය

ලූක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

ලූක් 10: 25-37

"මාගේ අසල්වැසියා කවරෙක් ද?"

එක්තරා විනයධරයෙක් නැඟිට ජේසුස් වහන්සේ පරීක්ෂා කරමින් "ගුරු දේවයෙනි, සදාතන ජීවනය හිමි ගරගනු සඳහා මා කුමක් කළයුතු දැ" යි ඇසීය. උන්වහන්සේට ඔහුට පිළිතුරු දෙමින් "ව්‍යවස්ථාවලියෙහි ලියා ඇත්තේ කිමෙක් ද? ඔබ එය තේරුම් ගන්නේ කෙසේ දැ"යි ඇසූ සේක. ඔහු උත්තර දෙමින් "නුඹේ මුළු හෘදයෙන් ද නුඹේ මුළු බුද්ධියෙන් ද නුඹේ දෙවි වූ ස්වාමින් වහන්සේටත්, නුඹ නුඹට ප්‍රේම කරන්නාක් මෙන් නුඹේ අසල්වැසියාටත් ප්‍රේම කරන්න යනු"ය යි කීය. උන්වහන්සේ "ඔබේ උත්තරය හරි ය. එසේ කරන්න. එවිට ඔබ ජීවත් වන්නෙහි ය"යි ඔහුට වදාළ සේක. එහෙත් ඔහු තමන් නිදොස් බව දන්වන්ට කැමැතිව "මාගේ අසල්වැසියා කවරෙක්දැ"යි ජේසුස් වහන්සේගෙන් ප්‍රශ්න කළේය.

ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින් මෙසේ වදාළ සේක. "එක් මිනිසෙක් ජෙරුසලමෙන් ජෙරිකෝව බලා යද්දී, සොර මුළකට අසු විය. සොරු ඔහුගේ වස්ත්‍ර පැහැර ගෙන ඔහුට තලා පෙළා, ඔහු අඩපණකොට දමා යන්නට ගියහ. ඒ අතර එක් පූජකයෙක් අහම්බෙන් ඒ මඟ යනුයේ ඔහු දැක පාරේ අනික් පැත්තෙන් ගියේය. එසේම ලෙවීයයෙක් ද එතැනට පැමිණ ඔහු දැක පාරේ අනික් පැත්තෙන් ගියේය. එහෙත් ඒ මඟින් ගමන් ගත් එක් සමාරිය ජාතික මිනිසෙක් ඔහු හුන් තැනට අවුත්, ඔහු දැක අනුකම්පා උපදවා ඔහු වෙතට ගොස් තෙල් හා මිදියුස ගල්වා, තුවාල බැඳ තමාගේ ම මෘගයා පිට හිඳුවා තානායමට ගෙන ගොස් ඔහු බලා ගත්තේය. පසුවදා ඔහු රිදී කාසි දෙකක් ගෙන තානායම්කාරයාට දී "මොහු බලාගන්න. මෙයට වැඩියෙන් ඔබ

වියදම් කරන යම් තරමක් ඇද්ද නැවත ආවිට මම එය ඔබට ගෙවන්නෙම්”යි කීය. ඉදින් සොරුන් අතට අසු වූ තැනැත්තාට මෙකී තිදෙනාගෙන් ද අසල්වැසියා වූයේ කවරෙක් ද කියා ඔබ සිතන්නෙහි ද? ‘ඔහුට දයාව දැක්වූ තැනැත්තා’ යයි විනයධරයා කීය. “ඔබත් ගොස් එසේම කරන්නැ”යි ජේසුස් වහන්සේ ඔහුට වදාළ සේක.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.